# ශ්‍රී ලංකා අධ්‍යාපන පර්යේෂණ සඟරාව




පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

2020

## හැඳින්වීම

සමස්තයක් වශයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කරන ලද විවිධ පර්යේෂණ, අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට ඉවහල් වන බව සිද්ධාන්තමය වශයෙන් පිළිගෙන ඇත. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ කරන ලද පර්යේෂණ ආශ්‍රිත අනාවරණ සහ නිගමන, අධ්‍යාපනික කර්තව්‍යයන් වඩා අර්ථවත් ලෙස සංවිධානය කිරීමෙහි ලා උපකාර වේ. එසේ ම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ නව ප්‍රතිවේද ලබා ගැනීමේ ලා ද පර්යේෂණ පාදක කර ගත් නව දැනුම උපකාර වේ. මේ සඳහා පූර්ව අවශ්‍යතාවක් වන්නේ පර්යේෂණ දැනුම ප්‍රචලිත කිරීම ය. පර්යේෂණ දැනුම ප්‍රචලිත කිරීමෙහි ලා එක් පියවරක් ලෙස ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව "ශ්‍රී ලංකා අධ්‍යාපන පර්යේෂණ සඟරාව" පළ කරනු ලැබේ.

## අරමුණු

1. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි විවිධ පර්යේෂණවල අනාවරණ හා නිගමන ද ඒවායින් හෙළි වන නවතම දැනුම ද ප්‍රචලිත කර සාකච්ඡාවට යොමු කිරීම
2. අධ්‍යාපන පර්යේෂණ පිළිබඳ උනන්දුවක් දක්වන අය පර්යේෂණ ක්‍රියාකාරකම්වල නියැළීමට දිරි ගැන්වීම
3. පර්යේෂකයන්, උගතුන්, ගුරුවරුන් සහ අධ්‍යාපන පර්යේෂණ කටයුතු පිළිබඳ ව උනන්දුවක් දක්වන හා ඒ සම්බන්ධ බහුවිධ ක්ෂේත්‍රවල සහ වෘත්තීන්හි නියැළි තැනැත්තන් අතර සංවාදයට අවස්ථා සැලසීම
4. අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි පර්යේෂණ ආශ්‍රිත ව තහවුරු වී ඇති ප්‍රායෝගික හා කාලෝචිත අදහස් සාකච්ඡාවට භාජන කිරීමෙන් අධ්‍යාපනය පිළිබඳ ව විශ්ලේෂණාත්මක චින්තනය දිරි ගැන්වීම
5. ශ්‍රී ලාංකික හා අන්තර්ජාතික පර්යේෂණ ආයතන සමඟ සම්බන්ධතා ඇති කර ගැනීම

## අන්තර්ගතය

පර්යේෂණ ලිපි, නිබන්ධ සාරාංශ, පර්යේෂණ පිළිබඳ සටහන් සහ ග්‍රන්ථ විචාර යන අංශවලින් ශ්‍රී ලංකා අධ්‍යාපන පර්යේෂණ සඟරාව සමන්විත වේ.

## පර්යේෂණ ලිපි සැපයීම සඳහා උපදෙස්

1. ලිපියක් දළ වශයෙන් 2 000 සිට 10 000 දක්වා වූ වචන ප්‍රමාණයකින් සමන්විත විය යුතු ය.
2. ලිපිය සමග එහි අන්තර්ගතය පිළිබඳ ව වචන 150කට නොවැඩි සාරාංශයක් සහ පර්යේෂක පිළිබඳ කෙටි හැඳින්වීමක් එවන්න.
3. ඒ 4 කඩදාසිවල දෙපස මි.මී. 25ක තීරයක් තිබෙන පරිදි, ද්විත්ව පරතරයක් ඇති ව එෆ්. එම් අභය **(FMAbhaya)** අක්ෂරයෙන් යතුරු ලියනය කරන්න.
4. සටහන්, චිත්‍ර, ඡායාරූප, සිතියම් සහ රේඛා තීරු ප්‍රස්තාර සුදු කඩදාසිවල කළුපාට තීන්තෙන් අඳින්න. නැත හොත් ඡායාරූප ගත කරන්න.
5. ලිපියේ භාෂාව ව්‍යක්ත විය යුතු අතර වියරණ, අක්ෂර වින්‍යාසය හා පද බෙදීම පිළිගත් සම්මුතිවලට අනුකූල විය යුතු ය.

6. සංඛ්‍යාලේඛන ලිපියේ නියමිත ස්ථානයේ ඇතුළත් කළ යුතු අතර වඩා දීර්ඝ සංඛ්‍යාලේඛන අනුපිළිවෙළින් අංක යොදා ලිපිය අවසානයේ පරිශිෂ්ට වශයෙන් යොදන්න.

7. (අ) පාද සටහන්, අනුගාමී අංක සහිත ව, ලිපිය අවසානයේ, ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලියට පෙර ඇතුළත් කරන්න.

(ආ) ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය ඇමරිකානු මනෝවිද්‍යාත්මක සංගමයේ ප්‍රකාශන අත්පිටපතේ ශෛලිය අනුගමනය කරමින් සකස් කරන්න. සිංහල පොත් පළමු ව ද ඉංග්‍රීසි පොත් දෙවනු ව ද සඳහන් කරන්න. මුල් පිටපත සහ තවත් පිටපතක් එවන්න.

පර්යේෂණ ලිපිවල ප්‍රකාශිත අදහස් ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රතිපත්ති පිළිබිඹු කරන ඒවා වීම අවශ්‍ය නො වේ.

## සමාලෝචන ක්‍රියාවලිය

අධ්‍යාපන පර්යේෂණ වාර සඟරාවෙහි පළ කිරීම සඳහා එවනු ලබන සියලු ලිපි මූලික සංස්කාරක සමාලෝචනයකට භාජන කරනු ලබන අතර පළ කිරීමට සුදුසු යැයි සැලකෙන ලිපි, උපදේශක සංස්කාරකයන් වෙත නිර්නාමික ව යවනු ලැබේ. නිර්නාමික බව රැක ගනු පිණිස අත්පිටපතෙහි ඒ ඒ පිටුවෙහි දැක්විය යුත්තේ පර්යේෂණ මාතෘකාව පමණකි.

අත්පිටපතට පර්යේෂකගේ නම, පර්යේෂණ මාතෘකාව සහ පර්යේෂක පිළිබඳ ජීව දත්ත දැක්වෙන ආවරණ ලිපියක් යා කළ යුතු ය. අත්පිටපත් බාර ගනු ලබන්නේ ලිපි අන්තර්ගතයට බල නොපාන්නා වූ සංස්කරණයට යටත් ව සහ ප්‍රථම වරට පළ කිරීමේ අයිතිය සඟරාව සතු වන බවට වූ කොන්දේසිය මත ය. එසේ ම ලිපියේ දිග ප්‍රමාණය, ශෛලියේ පැහැදිලිකම පිළිබඳ අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි හා ලිපියේ අන්තර්ගතයට හානියක් නො වන පරිදි සංස්කරණය කිරීමේ අයිතිය සංස්කාරක සතු වේ. අත්පිටපත් ලැබුණු බව සති දෙකක් ඇතුළත දුරකථනයෙන්, තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් දැනුම් දෙනු ලැබේ. අත්පිටපත සංස්කාරක වෙත ලැබී මාස තුනකට පසු ව ලිපිය සඟරාවෙහි පළ කිරීම සඳහා තෝරා ගෙන තිබේ ද නො තිබේ ද යන වග දැනුම් දෙනු ලැබේ.

## පර්යේෂණ ලිපි සඳහා ගෙවීම්

ජාතික අධ්‍යාපන ආයතනය මගින් අනුමත දීමනා ගෙවනු ලැබේ.

## නිබන්ධ සාරාංශ, පර්යේෂණ සටහන් සහ ග්‍රන්ථ විචාර සැපයීම සඳහා උපදෙස්

පර්යේෂණ සටහන් වචන 100ක ද, නිබන්ධන සාරාංශ වචන 1000ක ද, ග්‍රන්ථ විචේචන වචන 2000ක ද, උපරිමයකට යටත් ව සැපයිය හැකි ය. මේ අංග සැපයීම වෙනුවෙන් ගෙවීම් කරනු නො ලැබේ.

## ශ්‍රී ලංකා අධ්‍යාපන පර්යේෂණ සඟරාව පිළිබඳ සියලු ලිපි එවිය යුතු ලිපිනය

අධ්‍යක්ෂ
පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම